**ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**නිවාඩු කාලීන පාසල-2020 මාර්තු/අප්‍රේල්**

**ඉතිහාසය**

**07ශ්‍රේණිය__ප්‍රශ්නපත්‍ර 01**

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

අංක 01 සිට 05 දක්වා නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

01. සෙල් ලිපි වල අතීතයේ දී පිටි බිම් ලෙස හඳුන්වනුයේ .......................................
(සේන්, කුඹුරු, ගිනි යාති කාව, සොහොන් බිම්)

02. හෝපිටිගම වෙළඳසැල පිළිබඳ ......................................... සඳහන් ය.
(සොරබොර වැව් ලිපිය, බදුලු ටැම් ලිපිය, මහාවංශය, සද්ධර්මරත්නාවලිය)

03. ශ්‍රී මාර ශ්‍රී වල්ලභයන් මියගියේ ඉන්දියාවේ ............................................... දීය.
(පාණ්ඩ්‍යයේ, මදුරාපුරයේ, චෝලයේ, කාලිංගයේ)

04. පල්ලව රාජ්‍යයේ අගනුවර .................................... නම් වේ.
(සාංචිපුරය, මදුරාපුරය, තන්ජෝරය, අනුරාධපුරය)

05. I වන විජයබාහු රජු .................................... ප්‍රථම රජු වේ.
(අනුරාධපුර රාජධානියේ, පාණ්ඩ්‍යය රාජධානියේ, කොට්ටේ රාජධානියේ, පොළොන්නරු රාජධානියේ)

අංක 6 සිට 11 තෙක් ඇති ප්‍රශ්න වල නිවැරදි පිළිතුර යා කරන්න.

| | |
|---|---|
| 06. පණාකඩුව තඹ සන්නස | A. I වන විජයබාහු රජු |
| 07. නිශ්ශංක ලතා මණ්ඩලය | B. අම්බලන්ගොඩ |
| 08. මොහොන්දජාරෝ නගරය | C. ලන්දේසීන් |
| 09. සීගිරිය | D. I වන කාශ්‍යප රජු |
| 10. ගාලු කොටුව | E. නිශ්ශංකමල්ල රජු |
| 11. වෙස් කර්මාන්තය | F. පකිස්ථානය |

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

අංක 12 සිට 20 තෙක් ඇති ප්‍රශ්න වල නිවැරදි පිළිතුර තෝරා දී ඇති වරහනෙහි ලියන්න.

12. අස්පෘශ්‍ය උරුමයන් ලෙස හඳුන්වා ඇත්තේ,

I. අතින් ස්පර්ශ කළ හැකි උරුමයන්ය.
II. ඇම්බැක්කේ දේවාලය, චිත්‍ර වැනි දෑය.
III. ස්පර්ශ කළ හැකි හා දැකිය හැකි උරුමයන්ය.
IV. අතින් ස්පර්ශ කළ නොහැකි උරුමයන්ය. ( ...... )

13. රජරට ශිෂ්ටාචාර සමයේ දී දැකිය හැකි උත්සවයක් නොවන්නේ,

I. දළදා පෙරහැර උත්සවය.
II. වෙසක් උත්සවය.
III. ජල ක්‍රීඩා උත්සවය.
IV. වප් මගුල් උත්සවය. ( ...... )

14. ලාක්ෂා කර්මාන්තයේදී අමුද්‍රව්‍ය සඳහා යොදා ගන්නා කෘමියා වනුයේ,

I. කුරුම්ණියාය.
II. ගොයම් මැස්සාය.
III. ලාක්ෂා කෘමියාය.
IV. තණකොල පෙත්තාය. ( ...... )

15. ක්‍රි.ව. 1215 දී පොළොන්නරුව රාජධානිය ආක්‍රමණය කරන ලද්දේ,

I. මාර ශ්‍රී වල්ලභය.
II. කාලිංග මාඝය.
III. චෝලයන්ය.
IV. රාජේන්ද්‍ර රජය. ( ...... )

16. චන්ද්‍රභානු විසින් ආක්‍රමණය කරන ලද්දේ,

I. II වන පරාක්‍රමබාහු රජු සමයේදී ය.
II. I වන පරාක්‍රමබාහු රජු සමයේදී ය.
III. III වන විජයබාහු රජු සමයේදී ය.
IV. I වන බුවනෙකබාහු රජු සමයේදී ය. ( ...... )

17. කෝට්ටේ යුගයේ දී රචනා කරන ලද කෘතියක් නොවන්නේ,

I. සැළලිහිණි සංදේශය.
II. කාව්‍යශේකරය.
III. පැකුම්බා සිරිත.
IV. සසදාවත. ( ...... )

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

18. ග්‍රීක ශිෂ්ටාචාරය හඳුන්වනු ලබන්නේ,

I. චන්ද්‍රවංශයේ ශිෂ්ටාචාරය
II. යුප්‍රටීස් - ටයිග්‍රීස් ශිෂ්ටාචාරය
III. මිනෝවන් ශිෂ්ටාචාරය
IV. ඊජිප්තු ශිෂ්ටාචාරය ( ...... )

19. පෞර රාජ්‍යයක කැපී පෙනෙන ලක්ෂණයක් නොවන්නේ,

I. දේශපාලනඥයන් විසින් තීරණ ගැනීම.
II. ජනගහන සීමිත වීම.
III. භූමි ප්‍රදේශය සීමිත වීම.
IV. පුරවැසියන්ට පමණක් දේශපාලන අයිතිය හිමිවීම. ( ...... )

20. රෝම ශිෂ්ටාචාරයෙන් ලද දායාදයක් වන්නේ,

I. රෝම නීතිය
II. ඔලිම්පික් ක්‍රීඩාව
III. නූතන ප්‍රජාතන්ත්‍රවාදී පාලනය
IV. විද්‍යාව හා කලාව බිහිවීමේ පසුබිම ( ...... )

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

## II කොටස

❖ ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

(01)

I. තෝනිය ගල ශිලා ලිපියේ සඳහන් ආකාරයට ගොඩ ගොවිතැනේදී වී වගාකරන කන්න 03 හඳුන්වන නම් ලියන්න. (ලකුණු 03)

II. අතීතයේදී මෙරට පැවති කර්මාන්ත 04 ක් නම් කරන්න. (ලකුණු 04)

III. අතීතයේ මෙරට පැවති ප්‍රධාන වෙළඳ ක්‍රම 02 හඳුන්වා ඉන් 01 ක් පැහැදිලි කරන්න. (ලකුණු 12)

(02)

I. අතීත ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනයේදී රජුට සහාය වූ රාජ සභාවේ නිලධාරීන් 03 දෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

II. මානවම්ම රජු දවස මෙරට ක්‍රියාත්මක වූ නීති වර්ග 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. පොළොන්නරුව රාජධානියේ පළමු රජ වූ I වන විජයබාහු රජුගෙන් සිදුවූ සේවාවන් 05 ක් ලියන්න. (ලකුණු 12)

(03)

I. පළමුවන විජයබාහු රජුගේ මරණින් පසු රජරට බෙදුනු කොටස් 03 නම් කරන්න.
(ලකුණු 03)

II. පළමුවන පරාක්‍රමබාහු රජු විසින් කෘෂිකර්මාන්තය සඳහා අමුණු බැඳ ජලය සැපයූ ස්ථාන 04 ක් ලියන්න. (ලකුණු 12)

III. නිශ්ශංක මල්ල රජු හට මුහුණ දීමට සිදු වූ අභියෝග 02 ක් කෙටියෙන් පැහැදිලි කරන්න
(ලකුණු 12)

(04)

I. ස්පෘශ්‍ය උරුමයන් 03 ක් නම් කරන්න. (ලකුණු 03)

II. අ. ලෝක උරුමයන් තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක උරුමයන් 02 ක් නම් කරන්න.
(ලකුණු 02)

III. ශ්‍රී ලාංකිකයන් ලෙස අපගේ සංස්කෘතික උරුමයන් රැක ගැනීමේ වැදගත්කම් 05 ක් ලියන්න. (ලකුණු 12)

(05)

I. ක්‍රි.ව. 1215 දී මෙරට ආක්‍රමණය කළ විදේශික ජාතිකයා කවුද? (ලකුණු 01)

II. අ. එම ආක්‍රමණයේදී මෙරට ජනයාගේ ආරක්ෂාව සඳහා බලකොටු තැනූ සෙනවින් 03 දෙනා නම් කරන්න. (ලකුණු 03)

ආ. එම බලකොටු සැදූ ස්ථාන 03 නම් කරන්න. (ලකුණු 03)

III. “කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත” යන නාමාවලියෙන් දඹදෙණි යුගයේදී හඳුන්වන රජු නම් කර ඔහු විසින් සිදුකල සේවාවන් 04 ක් ලියන්න.
(ලකුණු 12)

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

(06)

I. අතීත ග්‍රීසියේ පෞර රාජ්‍යයන් තුල කැපී පෙනෙන ලක්ෂණ 03 ක් සඳහන්කරන්න.
(ලකුණු 03)

II. අ. අතීත ග්‍රීක වැසියන් ගොවිතැනේ දී භාවිතා කල ප්‍රධාන වගාවන් 02 ක් නම් කරන්න. (ලකුණු 02)

ආ. ග්‍රීකයන් සත්ව පාලනය සඳහා යොදාගත් සත්වයන් 02 ක් නම් කරන්න.
(ලකුණු 02)

III. අතීත ග්‍රීසියේ සිටි දාර්ශනිකයන් තිදෙනෙකු නම් කොට ඉන් දෙදෙනෙක් කුමන දෑ සඳහා ප්‍රසිද්ධ දැයි සඳහන් කරන්න. (ලකුණු 12)

(07)



I. ඉහත රූපයේ සඳහන් රෝම අධිරාජ්‍යයා කවුද? (ලකුණු 03)

II. අ. ඉහත අධිරාජ්‍යයාගේ සමයේ ඉදිකල ස්මාරක 02 ක් සඳහන් කරන්න.
(ලකුණු 02)

ආ. රෝම සමාජයේ සිටින සමාජ කොටස් 02 ක් සඳහන් කරන්න.
(ලකුණු 02)

III. රෝම ශිෂ්ටාචාරයෙන් ලොවට ලැබුණු උරුමයන් 05 ක් සඳහන් කරන්න.
(ලකුණු 12)

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION